2001. 05. 11

රා.ප.චක්‍රලේඛ අංක : 10/2001

ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
සමෘද්ධි හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
කම්කරු අමාත්‍යාංශය,
පරිසර අමාත්‍යාංශය,
වනිතා කටයුතු අමාත්‍යාංශය,

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

<u>ජාතික සෞඛ්‍ය සතිය - වසර 2001</u>

වර්ෂ 2001.02.28 වෙනි දින උක්ත කරුණ සම්බන්ධයෙන් සම්මත වු අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2001 වර්ෂය සඳහා මැයි 21-27 දක්වා දින හතක කාලය ජාතික සෞඛ්‍ය සතිය ලෙස පකාශයට පත් කර ඇත.

ජිවිත සුරැකීමට බෝවන රෝග වැලැක්වීම යන පධාන තේමාව යටතේ බෝවන හා බෝනොවන රෝග නිවාරණය හා සෞඛ්‍යයට හිතකර පරිදි පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කොට ගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සම්පාදනය කල 18 වැදැරුම් සෞඛ්‍ය සංරක්ෂණ කයාවලියෙන් අපේක්ෂිත පරිදි යහපත් ජීවන රටා වැඩි දියුණු කිරීමට හේතු කාරක වන මුලික කියාමාර්ග ජාතික සෞඛ්‍ය සතියට ඇතුලත් කර ඇත.

මෙම සෞඛ්‍ය සතිය තුළ කියාත්මක වන එකී ක්‍රියාකාරකම් සඳහා අදාල වු වැඩසටහන්වලට අනෙකුත් අමාත්‍යාංශවලින් අවශ්‍ය වන සක්‍රීය සහභාගීත්වය පහත සඳහන් අයුරු වන අතර, පළාත් අමාත්‍යාංශ සහ රේඛීය අමාත්‍යාංශ වල අදාල නිලධාරීන්ට ඒ සඳහා කටයුතු කිරීම සඳහා වහාම උපදෙස් නිකුත් කිරීම අත්‍යාවශ්‍ය බව ගරු අගමැති තුමාගේ ප්‍රධානත්වයෙන් 2001.05.10 වැනි දින පැවැත්වූ රැස්වීමේදී තීරණය කර ඇත.

1. <u>ගරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමන්ගෙන් අපේක්ෂිත සහාය</u>

1.1 ජාතික සෞඛ්‍ය සතිය සඳහා තම පළාත් තුල ක්‍රියාත්මක කලයුතු සෞඛ්‍ය වැඩසටහන් හඳුනා ගැනීම.

මෙය පළාත් සෞඛ්‍ය ඇමතිතුමන් හා පළාත් සෞඛ්‍ය ලේකම්/ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ සමග සාකච්ඡා කර සැලසුම් කිරීම වඩාත් උචිතය.

1.2 ඩෙංගු හා අනෙකුත් බෝ වන රෝග මර්ධන කටයුතු ශක්තිමත් කිරීමට අවශ්‍ය පළාත් කමිටු, දිස්ත්‍රික් කමිටු හා ප්‍රාදේශීය කමිටු ස්ථාපිත කිරීමට නිසි උපදෙස් නිකුත් කිරීම හා එම කමිටු වල ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම.

1.3 අදාල පළාත් අමාත්‍යාංශ සමග සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබා දීම.

1.4 සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දෙන ප්‍රතිපාදන වලට අමතරව, අවශ්‍ය කටයුතු සඳහා අවශ්‍ය අනෙකුත් ප්‍රතිපාදන හා සම්පත් පළාත් තුලින් ජනනය කර ගැනීම.

1.5 ජාතික සෞඛ්‍ය සතිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන පාසැල් වැඩසටහන් සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම සහ අවශ්‍ය උපදෙස් ලබා දීම.

1.6 තම ප්‍රදේශය හරහා ගමන් කරන සුවයාත්‍රා ප්‍රදර්ශණ රථ පෙරහැර අදාල විචිත්‍රාංග ඇතුලත් වැඩ සටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සහ උපදෙස් ලබා දීම.

1.7 සුව යාත්‍රා වැඩ සටහන වෙනුවෙන් අවශ්‍ය ආරක්ෂක කටයුතු ලබා දීම සඳහා අදාල පොලිස් ඒකක වල අනුග්‍රහය ලබා ගැනීම.

2. <u>පළාත් පාලන අමාත්‍යාංශය හා ආයතන වලින් අපේක්ෂිත සහාය</u>

2.1 බෝවන රෝග වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය අංශ මගින් සංවිධානය කරනු ලබන වැඩ සටහන් සාර්ථක කර ගැනීම සඳහා සහාය දැක්වීම.

2.2 කුණු කසල බැහැර කිරීම සම්බන්ධයෙන් ජනතාව දැණුවත් කිරීම හා ඒ සඳහා අවශ්‍ය සේවා ලබා දීම.

2.3 පරිසරය පිරිසිදු කිරීම සම්බන්ධව විවිධ ශ්‍රමදාන පවත්වන අවස්ථාවන්හිදී අවශ්‍ය සහයෝගය හා සේවා ලබා දීම.

2.4 ආහාර සුරක්ෂාව සම්බන්ධයෙන් කරනු ලබන දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැටලීම් යනාදී ක්‍රියා වලදී අවශ්‍ය සහයෝගය ලබා දීම.

2.5 මදුරු මර්ධනය සඳහා ක්‍රියාත්මක වන වැඩ සටහන් වලදී අවශ්‍ය සහයෝගය සහ මදුරු මර්ධන වැඩ කටයුතු ශක්තිමත් කිරීමට අවශ්‍ය සේවාවන් සැපයීම.

3. <u>අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

3.1 සෞඛ්‍ය සතිය සාර්ථක කර ගැනීම සඳහා පාසල් පද්ධතිය සක්‍රීයව සහභාගී කරවීම.

3.2 සෞඛ්‍ය සතිය තේමා කරගත් වැඩ සටහන් පාසල් තුල ක්‍රියාත්මක කරවීම සහ ඒ සඳහා සිසුන් තුලින්ම නායකත්වයක් ගොඩනැංවීම. (මේ සඳහා අදාල චක්‍රලේඛ දැනටමත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් තුමිය විසින් යවා ඇත.) මෙම වැඩ සටහන් වලට දේශණ, සම්මන්ත්‍රණ සහ දැනුම මිනුම, නාට්‍ය, චිත්‍ර, රචනා තරග ආදිය ඇතුලත් කල හැකිය.

3.3 සෞඛ්‍ය දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය සහ අනෙකුත් දෙපාර්තමේන්තු මගින් සංවි ධානය කරන පාසැල් වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

3.4 පාසල් පද්ධතිය තුල යහපත් සෞඛ්‍යයක් ඇතිකර ගැනීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පරිසරයක් ගොඩනැංවීම.

3.5 පාසැල් තුල පිහිටුවා ඇති සෞඛ්‍ය සමාජ ශක්තිමත් කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.

3.6 පාසැල් සිසුන් විපර්‍යකාරකයින් ලෙස යොදා ගැනීම

4. <u>කම්කරු අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

4.1 රැකියා සඳහා විදේශ ගත වන ශ්‍රී ලාංකිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සඳහා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය මගින් සෞඛ්‍ය වැඩ සටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මකකිරීම.

4.2 ඒඩ්ස් හා අනෙකුත් ලිංගාශ්‍රිත රෝග වලින් වලකින ආකාරය පිළිබඳව විදේශ රැකියා සඳහා යන ශ්‍රීලාංකිකයින්, සම්මන්ත්‍රණ, වැඩ මුළු, පුහුණු පන්ති යනාදී ක්‍රියාවලියක් තුලින් දැනුවත් කිරීම

5. <u>ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

5.1 18 වැදැරුම් සෞඛ්‍ය වැඩ පිළිවෙල සඳහා මහජනතාව දැනුවත් කර නිරන්තරයෙන්ම ජනතාවගේ මතකය අලුත් කිරීම සඳහා සක්‍රිය සහභාගීත්වය ලබා දීම.

5.2 ජාතික සෞඛ්‍ය සතිය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධව එයට අවශ්‍ය ජනමාධ්‍ය ප්‍රචාරක කටයුතු සඳහා සහයෝගය ලබා දීම.

6. <u>වනිතා කටයුතු අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

6.1 වනිතා සංවිධාන තුලින් ජාතික සෞඛ්‍ය සතිය සඳහා අවශ්‍ය වූ ජනතා සහභාගීත්වය ලබා දීමට කටයුතු කිරීම.

6.2 බෝවන හා බෝ නොවන රෝග වැලැක්වීම සඳහා කාන්තා සංවිධාන දැනුවත් කිරීම.

6.3 තම දරුවන් මත් පැන් වලට හා මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ශ්‍රී ලාංකික කාන්තාවන්ට ලබා දීම.

7. <u>සමෘද්ධි හා යෞවන කටයුතු අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

7.1 ජනතා සහභාගිත්වයෙන් රෝග නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

7.2 පරිසරය පවිත්‍ර කිරීමේ වැඩසටහන් වලට සහයෝගය ලබා දීම සහ ජනතා සහභාගීත්වය ඇති කිරීමට කටයුතු කිරීම.

7.3 සමෘද්ධිලාභීන් සහභාගී වන රැස්වීම් වලදී ජාතික සෞඛ්‍ය සතියේ අරමුණු පිළිබදව ඔවුන් දැනුවත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

7.4 සමෘද්ධි නියාමකයින් විපර්‍යාකාරකයින් ලෙස යොදවා ගැනීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම.

7.5 ඉහත සදහන් රෝග නිවාරණ හා පවිත්‍ර කිරීමේ වැඩ සටහන් සාර්ථකව ඉටු කර ගැනීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල වලට අවශ්‍ය සහාය ලබා දීම.

8. <u>පරිසර අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

8.1 සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන විවිධ පරිසර වැඩ සටහන් (පවිත්‍ර කිරීම් යනාදිය) සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

8.2 කුණු කසල බැහැර කිරීම/කර්මාන්ත ආශ්‍රිත අපද්‍රව්‍ය බැහැර කිරීම සහ මැසි,මදුරු මර්ධනය සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අදාල අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන සමග සම්බන්ධිකරණය ඇති කිරීම හා මග පෙන්වීම.

8.3 පරිසර නියමු භට කණ්ඩායම් වල සහයෝගය පාසැල් වලට ලබා දීම.

8.4 පරිසර සෞඛ්‍ය සංරක්ෂණය සඳහා අවශ්‍ය නීතිමය රාමු ශක්තිමත් කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදීම.

9 <u>පොලිස් දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත සහාය</u>

9.1 සෞඛ්‍ය සතිය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සංවිධානාත්මක කටයුතු සඳහා සහයෝගය දැක්වීම.

9.2 පෙරහැර පැවැත්වීම/ රැස්වීම් හා සුවයාත්‍රා වැඩසටහන් වලදී අවශ්‍ය ආරක්ෂාව සහ මාර්ග ආරක්ෂාව ලබා දීම.

9.3 විශේෂයෙන්ම හදිසි අනතුරු වලක්වා ගැනීම සහ ඒඩ්ස් මර්ධන කටයුතු සංවිධානය කිරීම ආදී කටයුතු වලදී අවශ්‍ය සහයෝගය ලබා දීම.

9.4 සෞඛ්‍ය රැක ගැනීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය සම්බන්ධයෙන් විවිධ මාතෘකා යටතේ පොලිස් නිලධාරීන් දැනුවත් කර වීම.

9.5 පළාත් මට්ටමින් සෞඛ්‍ය අණපනත් ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලන ආයතන වලට හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල වලට අවශ්‍ය සහාය ලබා දීම.

10 <u>දේශිය වෛද්‍ය අමාත්‍යාංශයෙන් අපේක්ෂිත සහාය</u>

10.1 සෞඛ්‍ය ප්‍රවර්ධනය හා රෝග නිවාරණය සඳහා වූ 18 වැදෑරුම් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ සටහන් සම්පාදනය කිරීම සහ එම වැඩ සටහන් පළාත් අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කිරීම.

10.2 දේශීය වෛද්‍ය ආයතන වල පිරිසිදු කිරීම් වැඩ සටහන් සංවිධානය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම.

**මෙම ජාතික සෞඛ්‍ය සතිය වැඩ සටහන තුලින් ජනතාවට උපරිම ඵලදායීතාවය ලබා දීම සඳහා අදාල සියලු අංශ වල සහභාගීත්වය අත්‍යාවශ්‍ය බව සැලකෙන අතර, එම වැඩ කටයුතු සැලසුම් කිරීම සුපරීක්ෂණය හා මෙහෙයුම් ද නිසි පරිදි ක්‍රියාත්මක කිරීම ද ඒ ඒ අමාත්‍යාංශ වලට අදාල වූ කාර්ය භාරයන් බවද සැලකුව මැනවි.**

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සෞඛ්‍ය සතිය සඳහා නිකුත් කල චක්‍ර ලේඛයේ පිටපතක් ද ඔබගේ කාරුණික අවධානය සඳහා මෙයට යා කොට ඇත.**

**එම්.එන් ජුනයිඩ්**
**ලේකම්,**